සෘජුව හෝ වක්‍රාකාරයෙන් කොටස් වෙළඳාම් පොළක් වෙත බලපෑම් කරන සාධක

ඉහළ ප්‍රතිලාභ ලබාදෙන කොටස් වෙළෙඳ පොළක් වෙත සෘජුව හෝ වක්‍රාකාරයෙන් බලපෑම් කරන සාධක පිළිබඳව දැනට ආයෝජනයේ නිරත වන්නන් මෙන්ම, ඉදිරියේදී ආයෝජනයට ප්‍රවිෂ්ට වන්නන්ද හොඳින් දැනුවත්ව සිටීම වැදගත්ය. ඒ අනුව, රජයේ ප්‍රතිපත්ති, ආර්ථික ප්‍රතිපත්ති වෙනස්වීම, වෙළෙඳ පොළ ප්‍රවණතා සහ ආයෝජන මතය, රටේ ආර්ථික වර්ධන අනුපාතය, නීති සහ නියාමනයන්හි සිදුවන වෙනස්වීම්, රටේ උද්ධමන අනුපාතය, අමුද්‍රව්‍ය මිල ගණන් වෙනස්වීම, විනිමය අනුපාත, වෙළෙඳ හිඟය, පොලී අනුපාත, විදේශ විනිමය ගලායාම හෝ ගලාඒම, ජාත්‍යන්තර වෙළෙඳාම හා සම්බන්ධ නීතිරීතිවල සිදුකෙරෙන වෙනස්කම් සහ පෞද්ගලික අංශයේ ඉතිරිකිරීම් අඩු වැඩිවීම ආදී මාතෘකා ගැන පසුගිය ලිපි තුළින් සාකච්ඡා කළ අපි, මෙවරත් ඒ සාකච්ඡාව ඉදිරියට සිදුකරන්නෙමු.

අනෙකුත් කොටස් වෙළෙඳ පොළවල්වල සිදුවන වෙනස්කම්

අප කොටස් වෙළෙඳ පොළ තුළ ආයෝජනය කරනුයේ දේශීය ආයෝජකයන් පමණක් නොව, විදේශීය ආයෝජකයන්ද එහි ආයෝජනය කරනු ලබයි. විදේශීය ආයෝජකයා යම් කොටස් වෙළෙඳ පොළක ආයෝජනය කරනුයේ එමගින් තම ආයෝජනයට ඉහළ ප්‍රතිලාභයක් ලබාගත හැකි නිසාය. ඒ අනුව, කාර්යසාධනය අතින් ඉහළ කොටස් වෙළෙඳ පොළවල් සොයාගැනීමට විදේශීය ආයෝජකයෝ පෙළඹෙති. ඒ අනුව, අප කොටස් වෙළෙඳ පොළටද ලොව අනෙකුත් රටවල කොටස් වෙළෙඳ පොළ තත්ත්වය සෘජුවම බලපානු ඇත. මේ අනුව, සියලු ආයෝජකයන්ට කොටස් වෙළෙඳ පොළ තුළින් ඉහළ ප්‍රතිලාභ ලබාගැනීමට යහපත් දේශපාලන ආර්ථික පරිසරයක් රට තුළ නිර්මාණය විය යුතුය.

ආයෝජකයන්ට සුදුසු වටපිටාවක්

ආයෝජන සඳහා සුදුසු තත්ත්වයක් තමන් ජීවත්වන පරිසරය තුළ තිබිය යුතුය. ආයෝජනයට සුදුසු ව්‍යාපාර රට තුළ බිහිවිය යුතුය. ලිහිල් නීතිරීති හඳුන්වාදී තිබිය යුතුය. බදු සහන සහ ලිහිල් බදු ප්‍රතිපත්ති හඳුන්වාදී තිබිය යුතුය. නිදහසේ තම ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අවශ්‍ය පරිසරයක් රට තුළ නිර්මාණය වීම තුළින් ආයෝජකයන් වැඩි වශයෙන් ආයෝජනය කිරීමට හේතු වේ. අනවශ්‍ය දේශපාලන මැදිහත්වීම්වලින් ව්‍යාපාරිකයන් ආරක්ෂා කළ යුතුය. එවිට කොටස් වෙළෙඳ පොළ ඇතුළු අනෙකුත් ආයෝජන සඳහා සුදුසු තත්ත්වයක් ස්වභාවිකවම ඇතිවේ.

දේශපාලන අස්ථාවරත්වයක් පැවතීම

ආයෝජකයන් අනාගතය පිළිබඳ සිතන ආකාරය වෙනස් වීමට රටක පවතින දේශපාලන තත්ත්වයද බලපෑ හැකිය. විශේෂයෙන්ම, නිතර වෙනස්වන දේශපාලන තත්ත්වයක් තුළ මහා පරිමාණ ආයෝජන කිරීමට ආයෝජකයෝ මැලිකමක් දක්වති. මන්දයත්, අස්ථාවර දේශපාලන, ආර්ථික ප්‍රතිපත්තිවල යම් වෙනසක් සිදුවිය හැකි බැවිනි. දේශීය මෙන්ම විදේශීය ආයෝජකයන්ද නිතර වෙනස්වන දේශපාලන තත්ත්වයක් සහිත ආර්ථිකයන්හි ආයෝජනය කිරීමට කැමැත්තක් නොදක්වයි. මීට අමතරව, රටක මූල්‍ය තත්ත්වය, වැටුප් මට්ටම් හා සමස්ත ඉල්ලුම හා සමස්ත සැපයුම් තත්ත්වයද ඉහත සාකච්ඡා කළ කරුණුවලට අමතරව කොටස් වෙළෙඳ පොළ වෙත යම් යම් බලපෑම් ඇති කරන බව කිව හැකිය.